# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 291 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 18/02/2024 පැය 0940

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - අළුත්ගම පොලිස් වසම.

2024.02.17 වන දින රාත්‍රී කාලයේ අළුත්ගම පොලිස් වසමේ මොරගල්ල ප්‍රදේශයේ කාන්තාවකට පහරදීමක් හේතුවෙන් බේරුවල රෝහලට ඇතුලත් කළ කාන්තාවක් මියගොස් ඇති බවට අළුත්ගම පොලීසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 47 ක් වූ මොරගල්ල, බේරුවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය හා ඇගේ ස්වාමි පුරුෂයා අතර ඇතිවූ ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදු වී ඇති බවත් සැකකාර සැමියා විසින් පහර දීමකින් මෙම ඝාතනය සිදුවන්නට ඇති බවටත් පොලිසිය විසින් සැකකරනු ලබයි.

ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 57 ක් වන සැකකාර සැමියා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා බේරුවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අළුත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශය.

2024.02.18 වන අද දින අළුයම් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බෙලෙක් කඩේ හා රත්මලාන ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස බුද්ධි අංශයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීම් 02ක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 49 වයස්වල පසුවන අත්තිඩිය හා රත්මලාන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් හමුවීම - මාදම්පේ පොලිස් වසම.

2024.02.17 වන දින සවස් කාලයේදී මාදම්පේ පොලිස් වසමේ තනිවැල්ලේගම වැව් ඉවුර ආසන්නයේ කැලෑබඳ ප්‍රදේශයේ පුද්ගලයෙකු මියගොස් සිටින බවට මාදම්පේ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ තනිවැල්ලේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුට ඥාතීන් හෝ වෙනත් භාරකරුවෙකු නොමැතිවීම හේතුවෙන් තනිවැල්ලේගම ප්‍රදේශයේ විහාරස්ථානයක නතරව සිටි අයෙකු වේ. මොහු මානසික රෝගයකින් හා මීමැස්මොරය රෝගයෙන් පෙළෙන පුද්ගලයෙකු බවත්, මීට දින 03 ක සිට මෙම පුද්ගලයා අතුරුදහන්ව සිට ඇති බවද සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාදම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.